# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,372 - 2024 පෙබරවාරි මස 16 වැනි සිකුරාදා - 2024.02.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 42 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 43 |


*සැ. යු.*- (i) අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත, 2024 පෙබරවාරි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත, 2024 පෙබරවාරි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත, 2024 පෙබරවාරි මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 මාර්තු 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 පෙබරවාරි මස 22 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## බලංගොඩ දිසා අධිකරණයේ දී ය

### පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

වෙළඟේ දවුල්කාරගේ ගාමිණී විජේසිංහ,
ඉළුක්කුඹුර,
පනාන,
ඕපනායක.

*නඩු අංකය* : 5759
*ස්වභාවය* : මුදල්
කාර්ය පටිපාටිය : ලඝු
*වටිනාකම* : රු. 250,000/-

............................*පැමිණිලිකරු.*

*එදිරිව*

ගෝවින්දසාමි ඉලයරාජ්,
චන්ද්‍රිකාවත්ත,
ඉළුක්කුඹුර,
ඕපනායක.

.............................*විත්තිකරු.*

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2020 ක් වූ මාර්තු මස 04 වැනි දින ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය ප්‍රකාර ඉහත නම් සඳහන් විත්තිකරුට එරෙහිව පැමිණිලිකරුට පහත සඳහන් සහන ලබාගත හැකි බවට තීන්දු කර ඇත.

*(අ)* රුපියල් ලක්ෂ දෙකක (රු. 200,000/-) මුදලක් අයකර ගැනීමට

එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති දේපළ තහනමට ගෙන විකිණීමේ ඇස්කීසියේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරු සතු චංචල දේපළ වර්ෂ **2024.03.06** වැනි දින ප. ව. **2.00** ට ඕපනායක, ඉළුක්කුඹුර, චන්ද්‍රිකාවත්ත දරන ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. සැම්සුන් වර්ගයේ අඟල් 32 LED රූපවාහිනිය
2. වානේ ටී. වී. ස්ටෑන්ඩ් 01
3. පැනසොනික් DVD ප්ලේයරය
4. අඩි 6 x 5 දොර දෙකේ වානේ අල්මාරිය
5. පියන් සහිත ටී. වී. රැඳවිය හැකි කැබිනට් 1
6. අඩි 12 x 4 කැබිනට් 1
7. ප්ලාස්ටික් කෑම මේසෙ පුටු 06
8. Tomahawk වර්ගයේ පාපැදිය

ඒ. ඩී. සුරවීර,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
බලංගොඩ.

02-554

# විවිධ දැන්වීම්

## ස්වකීය සිවිල් සහ වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන (කොළඹ දී පවත්වනු ලබන) බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ වන ගණන් බේරා වසා දැමීම සම්බන්ධ කාරණාවේ දී ය.

*නඩු අංකය* : CHC/06/24 CO
*ස්වභාවය* : ඈවර කිරීම
කාර්ය පටිපාටිය : සාමාන්‍ය
*වටිනාකම* : රු. 29,000,000/-

ලංකෙයිලා (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී. වී. අංක 00260897
පීකොක් බීච් හොටෙල්, තිස්ස පාර, හම්බන්තොට.

දිලිනි කල්පනා ගුරුගේ,
අංක 220/ඒ, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

....................*පෙත්සම්කාරිය.*

බස්නාහිර පළාතේ, වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් පෙත්සම්කාරිය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක් **2024ක් වූ ජනවාරි මස 16** වැනි දින එකී අධිකරණය වෙත පෙත්සම්කාරිය වෙනුවෙන් නීතිඥ අනුරාධ සෙනරත් වේරගොඩ විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම සම්බන්ධයෙන් සමාගම වෙත නොතීසි නිකුත් කර වාර්තා **2024ක් වූ මාර්තු මස 27** වැනි දිනට කැඳවීමට නියමකර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධවීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණය හිමියෙකු හෝ සහදායකයකු වේ නම් ඒ තැනැත්තාට තත්කාර්ය සඳහා එය විභාග කරන අවස්ථාවේ දී පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍යවන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයෙකු ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

අනුරාධ සෙනරත් වේරගොඩ,
පෙත්සම්කාරියගේ නීතිඥ,
අංක 41/1/2, බෙල්මන්ට් වීදිය, කොළඹ 12.

*සටහන.*- එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ දී පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ අනුරාධ සෙනරත් වේරගොඩ වෙත භාරදිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතු ය. එම දැන්වීමෙහි ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය ද ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතු ය. එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන් ම 2024ක් වූ මාර්තු මස 26 වැනි දින සවස 6.00ට පෙර ලැබෙන ලෙස භාර දිය යුතු ය. *නැතහොත්* තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතු ය.

02-561

**සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය**

2007 අංක 07 දරන සමාගම් පනතෙහි 272 වගන්තිය සමග කියවිය යුතු වර්ෂ 1939 සමාගම් ඇවර කිරීමේ රීති පිළිබඳ විධිවිධාන ප්‍රකාරව අධිකරණය මගින් ඇවර කිරීම සඳහා වන ඉල්ලීම පිළිබඳ කාරණාවේ දී ය.

*නඩු අංකය* : 94/2023/CO
*ස්වභාවය* : ගණන් බේරා වසා දැමීම
කාර්ය පටිපාටිය : සාමාන්‍ය

සිංහගිරි (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 515,
ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

...................*පෙත්සම්කරු.*

*එදිරිව*

ඉන්ෆිනිටිකොම් (ප්‍රයිවට්) ලිමිටඩ්,
8A, 89,
පාමංකඩ පාර,
කොළඹ 05.

..................*වගඋත්තරකරු.*

බස්නාහිර පළාතේ, වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් පෙත්සම්කරු විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක් **2023ක් වූ ඔක්තෝබර් මස 27 වැනි දින** එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ ධම්මිකා ජිමිනිගේ විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම සම්බන්ධයෙන් සමාගම වෙත නොතීසි නිකුත් කර වාර්තා **2024ක් වූ පෙබරවාරි මස 26 වැනි දිනට** කැඳවීමට නියම කර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධවීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණයහිමියෙකු හෝ සහදායකයෙකු වේ නම් ඒ තැනැත්තාට තත්කාර්ය සඳහා එය විභාග කරන අවස්ථාවේ දී පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍යවන එකී සමාගමේ ඕනෑම ණයහිමියකුට හෝ සහදායකයකු ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ :

ධම්මිකා ජිමිනිගේ,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 16/G/9, කොස්හේන පාර,
මාලබේ.

*සටහන.-* එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ දී පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ ධම්මිකා ජිමිනිගේ වෙත භාරදිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතු ය. එම දැන්වීමෙහි ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය ද ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතු ය. එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන් ම 2024ක් වූ පෙබරවාරි මස 25 වැනි දින සවස 6.00ට පෙර ලැබෙන ලෙස භාර දිය යුතු ය. *නැතහොත්* තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතු ය.

02-557

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.